නුවනත විද්‍යුත් සිංහල සඟරාව
වෙළුම 01, 2022, 52 - 58

සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

# නවකතාව සම්බන්ධ උපශානර බිහිවීමෙහි ලා අන්තර්ශික්ෂණයේ (Interdisciplinary) බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් නවකතා ඇසුරිනි)

## සාරසංක්ෂේපය

අන්තර්ශික්ෂණය යන්නෙන් විවිධ විෂයයන් අතර එනම් විවිධ ශික්ෂණයන් අතර පවතින්නා වූ අන්තර් ක්‍රියාකාරීත්වය අදහස් කෙරේ. අන්තර් ශික්ෂණමය ස්වභාවය සමාජයේ සෑම ක්ෂේත්‍රයක ම පවතින අතර සාහිත්‍යමය පඨිතවලට එනම් සාහිත්‍යමය වියමන්වලට අදාළ ව ද අන්තර්ශික්ෂමණය සංකල්පයක් ලෙස වැදගත් වේ. සාහිත්‍ය ශානරයක් ලෙස නවකතාව සැලකූ විට එහි ද අන්තර්ශික්ෂණමය ස්වභාවය ප්‍රමුඛ ලෙස ප්‍රකට කරන බව හඳුනා ගත හැකි ය. එහි දී නවකතාව සම්බන්ධ උපශානර බිහි වීම කෙරෙහි ද නවකතාවේ අන්තර්ශික්ෂණමය පෝෂණය බලපා ඇති බව හඳුනා ගත හැකි ය. නවකතාවේ විවිධ උපශානර බිහි වීමට අන්තර්ශික්ෂණමය සංකල්පයේ බලපෑම කෙබඳු ද යන්න විමසීම මෙහි පර්යේෂණ ගැටලුව විය. අන්තර්ශික්ෂණය සංකල්පීය වශයෙන් හා න්‍යායාත්මක ව විග්‍රහ කිරීම හා නවකතාවේ අන්තර්ශික්ෂණමය පෝෂණය, නවකතාව සම්බන්ධ උපශානර බිහි වීමට බලපෑ ආකාරය සවිස්තරාත්මක ව විශ්ලේෂණය කිරීම වශයෙන් පර්යේෂණයේ ප්‍රධාන අරමුණු දෙකක් විය. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාලය භාවිතයෙන් සපයා ගන්නා ලද ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය දත්ත ආශ්‍රයෙන් සිදු කරන ලද්දකි. මුල්කාලීන සමාජය තුළ ප්‍රබන්ධ කථා වශයෙන් හඳුන්වනු ලැබූ නවකතාව පසුකාලීන ව ඓතිහාසික නවකතා, දේශපාලන නවකතා, මනෝවිද්‍යාත්මක නවකතා, සමාජ විද්‍යාත්මක නවකතා, රහස් පරීක්ෂක නවකතා, යුද්ධ නවකතා ආදි වශයෙන් විවිධ ශානරවලට බෙදා වෙන් කර ඇති ආකාරයක් නිරීක්ෂණය කළ හැකි ය. මෙලෙස නවකතාවේ විවිධ ශානර නිර්මාණයෙහි ලා නවකතාවෙහි අන්තර්ශික්ෂණමය පෝෂණය බලපෑම් කර ඇති ආකාරය නවකතා කිහිපයක් ඇසුරින් විමර්ශනයට භාජනය වුණි. එහි දී පියදාස වැලිකන්නගේ **සුදු සෙවණැලි** නවකතාව, ඩබ්ලිව්. ඒ. සිල්වාගේ **විජයබා කොල්ලය** නවකතාව, සිරි ගුනසිංහගේ **හෙවනැල්ල** නවකතාව, සමන් වික්‍රමාරච්චි විසින් රචිත **අප්පච්චි ඇවිත්** නවකතාව යන නවකතා ආශ්‍රයෙන් අධ්‍යයනය සිදු විය. නවකතා වර්ගීකරණයේ දී **සුදු සෙවණැලි** හා **විජයබා කොල්ලය** ඓතිහාසික නවකතා ගණයට ගැනෙන අතර, **හෙවනැල්ල** හා **අප්පච්චි ඇවිත්** නවකතා ද්විත්වය මනෝවිද්‍යාත්මක නවකතා ශානරයට වෙන් කර දක්වයි. ඓතිහාසික නවකතාවේ දී යම් ඓතිහාසික පුවතක් නවකතාවේ අන්තර්ගතය, ආකෘතිය ආදිය වෙනස් කිරීමට යොදා ගෙන ඇති බව **සුදු සෙවණැලි** හා **විජයබා කොල්ලය** නවකතා අධ්‍යයනයෙන් පැහැදිලි වේ. සවන විජයබාහු රජුගේ පුතුන් තිදෙනා වූ බුවනෙකබාහු, රයිගම් බණ්ඩාර සහ මායාදුන්නේ විසින් 1521 දී තම පියා ඝාතනය කිරීමේ ඓතිහාසික සිදුවීම විජයබා කොල්ලය නමින් හඳුන්වන අතර, එය පාදක කර ගනිමින් **විජයබා කොල්ලය** නවකතාව ද 1948 ජාතික විමුක්ති අරගලය පාදක කොටගෙන සමාජ, ආර්ථික, දේශපාලනමය හා සංස්කෘතිකමය වශයෙන් සිදු වූ විපරිණාමය ඇසුරෙන් **සුදු**

9 772950 655005

**සෙවණැලි** නවකතාව ද රචනා වී ඇති බව හඳුනා ගත හැකි ය. ඒ අනුව නවකතාව ඉතිහාසගත සිදුවීම් පාදක කර ගැනීම මගින් ඉතිහාසය හා නවකතාව අතර අන්තර්ශික්ෂණමය වශයෙන් පෝෂණය වී ඇති බව ද එම කරුණු පාදක කර ගනිමින් ඓතිහාසික නවකතා ශානරය නවකතා සාහිත්‍යයෙහි නිර්මාණය වී ඇති බව ද පැහැදිලි ය. එසේ ම මනෝ විද්‍යාත්මක නවකතාවක් ලෙස සැලකෙන **හෙවනැල්ල** නවකතාව පුරා ම ජිනදාස නම් තරුණයෙකු මගින් පුද්ගල මනෝභාවයන්ගේ ක්‍රියාකාරිත්වය විග්‍රහ කරන අතර, **අප්පච්චි ඇවිත්** නවකතාවෙහි ද නිශ්ශංක නම් කේන්ද්‍රීය චරිතයෙහි මානසික සිතිවිලිවල ස්වරූපය ආශ්‍රයෙන් නවකතාව දිග හැරෙයි. එම නවකතා ද්විත්වය රචනා කිරීමේ දී මනෝ විද්‍යාවේ ස්වභාවය පිළිබඳ මනා අධ්‍යයනයක් සිදු කොට ඇති බැව් පැහැදිලි ය. ඒ අනුව නවකතාව හා මනෝ විද්‍යා විෂයයන්හි පවත්නා අන්තර්ශික්ෂණමය පෝෂණය **හෙවනැල්ල** හා **අප්පච්චි ඇවිත්** යන නවකතාවන්හි මූලික තේමාවට මනෝ විද්‍යාත්මක කරුණු විෂය වීමටත් එලෙස මනෝවිද්‍යාත්මක නවකතා නම් ශානරයක් ඇති වීමට ද බලපා ඇති බව පැහැදිලි ය. සියලු කරුණු අනුව ඓතිහාසික නවකතා, මනෝවිද්‍යාත්මක නවකතා ආදි නවකතාවේ ශානර බිහි වීමට නවකතාවේ අන්තර්ශික්ෂණමය පෝෂණය බලපා ඇති බව නිගමනය කළ හැකි ය.

## හැඳින්වීම

විවිධ විෂයයන් අතර එනම් විවිධ ශික්ෂණ අතර පවතින්නා වූ අන්තර් ක්‍රියාකාරීත්වය අන්තර්ශික්ෂණය යන්නෙන් අදහස් කෙරේ. සාහිත්‍ය වියමන කිසිවිටෙක සරල රේඛීය දෙයක් නොවන අතර, එය ස්වභාවයෙන් ම කිසියම් බහුවිධ මාන හා බහු අර්ථ ගැබ් කර ගත් දෙයක් වේ. මෙකී බහු අර්ථ හඳුනා ගැනීමේ දී අන්තර්ශික්ෂණය නම් සංකල්පය පිළිබඳ හැදෑරීම අතිශය වැදගත් වන අතර සාහිත්‍යමය ශානරයක් ලෙස නවකතාවෙහි පවත්නා අන්තර්ශික්ෂණමය ස්වභාවය හඳුනා ගැනීම වැදගත් වේ. එහි දී නවකතාවේ අන්තර්ශික්ෂණමය පෝෂණය නවකතාවේ විවිධ උපශානර නිර්මාණයෙහි ලා බලපෑ ආකාරය විමසිය යුතු ය. මුල් යුගයේ ප්‍රබන්ධ කථා ලෙස පොදුවේ හඳුන්වනු ලැබූ නවකතාව පසුකාලීන ව මනෝවිද්‍යාත්මක නවකතා, ඓතිහාසික නවකතා, දේශපාලන නවකතා, යුධ නවකතා ආදි වශයෙන් ශානර බිහි වීම පිළිබඳ විමසීම කළ යුතු ය. එලෙස සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි විවිධ වර්ගීකරණ යටතේ නවකතාවෙහි උපශානර නිර්මාණයෙහි ලා අන්තර්ශික්ෂණමය සංකල්පයේ බලපෑම මෙහි දී විචාරාක්ෂියට බඳුන් කෙරේ.

## පර්යේෂණයේ අරමුණු

අන්තර්ශික්ෂණය සංකල්පය සංකල්පීය ව හා න්‍යායාත්මක ව විග්‍රහ කිරීම

නවකතාවේ අන්තර්ශික්ෂණමය පෝෂණය නවකතාව සම්බන්ධ උපශානර බිහිවීමට බලපෑ ආකාරය සවිස්තරාත්මක ව විශ්ලේෂණය කිරීම

9 772950 655005

## සාහිත්‍ය විමර්ශනය

නවකතාව ලොව ප්‍රබල සාහිත්‍ය ප්‍රවර්ගයක් ලෙස මුල් කාලයේ සිට ම වෙනත් ශික්ෂණ සමග සම්බන්ධ ව පැවතිණි. **ග්‍රැහැම් හෆ්** විසින් රචිත **ඒ.වී. සුරවීර** අනුවාදය කරන ලද **සාහිත්‍ය විචාර රචනා** **(2009)** කෘතියෙහි නවකතාව මගින් සියලු ක්ෂේත්‍ර අනාවරණය කෙරෙන බව සඳහන් වේ. එසේ ම නවකතාව මගින් දේශපාලන හා සමාජ ඉතිහාසය විවිධාකාර බව ද විග්‍රහයක් දක්වා තිබේ. ඒ අනුව නවකතාව බොහෝ ක්ෂේත්‍ර සමග සම්බන්ධ ව පවතින බව එහි දී හඳුනා ගත හැකි නමුත් අන්තර්ශික්ෂණමය පෝෂණීය තත්ත්වය න්‍යායාත්මක වශයෙන් සාකච්ඡා වීමක් හෝ අන්තර්ශික්ෂණමය පෝෂණය නවකතාවේ ශානර බිහි වීම පිළිබඳ සාකච්ඡා වී නොමැත. එසේ ම **ඒ.වී. සුරවීර** විසින් රචිත **සමාජීය සාහිත්‍ය අධ්‍යයනය (1982)** කෘතියෙහි සාහිත්‍ය කෘතිය ම කේන්ද්‍ර කර ගනිමින් අගය කිරීමකට වඩා පුළුල් තිරයක පිහිටා අධ්‍යයනය කළ යුතු විෂයයක් සේ සලකා ඇත. එනම් සාහිත්‍යය තනි ව හැදෑරිය හැකි විෂයයක් නොවන බවත් එය ඉතිහාසය, මානව විද්‍යාව, සමාජ විද්‍යාව, දර්ශනය, ආර්ථික විද්‍යාව ආදි ක්ෂේත්‍ර සමග සම්බන්ධ කොට හැදෑරිය යුතු බව අවධාරණය කොට තිබේ. සාහිත්‍යය බොහෝ ක්ෂේත්‍ර සමග අන්තර් සම්බන්ධතාවක් පවත්වන බව මෙහි දී දක්වා තිබුණ ද එකී සම්බන්ධතාව නවකතාව සම්බන්ධ ශානර බිහි වීමෙහි ලා බලපා ඇති ආකාරයක් සාකච්ඡා වී නොමැත. **අගලකඩ සිරිසුමන හිමි** හා **නාලක ජයසේන** විසින් සංස්කරණය කරන ලද **සිංහල අධ්‍යයන ක්ෂේත්‍රයේ අන්තර්ශික්ෂණමය ස්වභාවය (2018)** කෘතියෙහි සාහිත්‍යය යන ශික්ෂණය සමාජ විද්‍යාව, මානව විද්‍යාව, දේශපාලන විද්‍යාව ආදි වශයෙන් වෙනත් ශික්ෂණ සමග සම්බන්ධ කර අධ්‍යයනයට ලක් කිරීම අන්තර්ශික්ෂණය හැදෑරීම ලෙස අර්ථ එක් කරමින් එවැන්නක් සඳහා මූලික අඩිතාලමක් නිර්මාණය කර තිබුණ ද අන්තර්ශික්ෂණය පිළිබඳ හෝ අන්තර්ශික්ෂණය හේතුවෙන් නිර්මාණය වන්නා වූ ශානර බිහි වීම පිළිබඳ සාකච්ඡා වීමක් නොමැත. මේ ආකාරයෙන් විවිධ විෂයයන් සාහිත්‍ය හා නවකතාව සමග සම්බන්ධය පිළිබඳ සාකච්ඡාවට ලක් ව ඇතත් පොදුවේ නවකතාවේ අන්තර්ශික්ෂණමය පෝෂණය ස්වභාවය හා එකී පෝෂණය නවකතාවේ උපශානර බිහි වීමට බලපෑ ආකාරය පිළිබඳ සාකච්ඡාවට ලක් වී නොමැති බව ප්‍රතීත වන හෙයින් මෙම අධ්‍යයනය පූර්ව අධ්‍යයනයන්ගෙන් විශේෂ කොට සැලකිය හැකි ය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය යොදා ගනිමින් සිදු කරන ලද පර්යේෂණයකි. පර්යේෂණය සිදු කිරීමේ දී පුස්තකාලය ගවේෂණය ප්‍රධාන වශයෙන් යොදා ගත් අතර, තොරතුරු හඳුනා ගැනීමේ දී ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයක මූලාශ්‍රය පරිශීලනය කෙරෙහි අවධානය ප්‍රමාණවත් ව යෙදවිණි. එහි දී ප්‍රාථමික මූලාශ්‍රය පරිශීලනය මගින් හඳුනා ගන්නා ලද තොරතුරු සහ එම ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරෙන් රචිත පසුකාලීන ලේඛකයන්ගේ නිර්මාණ අධ්‍යයනයෙන් හඳුනා ගත් තොරතුරු අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ ගැඹුරින් සාකච්ඡාවට ලක් කරන ලදි. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සිරි ගුනසිංහගේ **හෙවනැල්ල** නවකතාව, පියදාස වැලිකන්නගේ **සුදු සෙවණැලි**

නවකතාව, සමන් වික්‍රමාරච්චිගේ (2020) **අප්පච්චි ඇවිත්** නවකතාව, ඩබ්.ඒ. සිල්වා විසින් රචිත **විජයබා කොල්ලය** නවකතාව, ඒ.වි. සුරවීර විසින් රචිත **සමාජීය සාහිත්‍ය අධ්‍යයනය** කෘතිය, මීණිවන් පී. තිලකරත්න විසින් රචිත **සියවසක පෙරළිය හා සිංහල නවකතාවේ පදනම** කෘතිය, ප්‍රේමචන්ද්‍ර මාගම්මන විසින් රචිත **සිංහල නවකතාවේ නව නැම්ම**, උදය ප්‍රශාන්ත මැද්දේගම විසින් රචිත **සියවසක සිංහල නවකතා කෘතිය,** පරිශීලනය සිදු විය. අගලකඩ සිරිසුමන හිමි සහ නාලක ජයසේන විසින් සංස්කරණය කරන ලද **සිංහල අධ්‍යයන ක්ෂේත්‍රයේ අන්තර්ශික්ෂණීය ස්වභාවය කෘතිය** ද්විතීයක මූලාශ්‍රය වශයෙන් අධ්‍යයනය කරන ලදි. මීට අමතර ව අන්තර්ජාල පරිශීලනය, පුවත්පත් සඟරාදිය පරිශීලනය මගින් ද තොරතුරු එක් රැස් කර ගන්නා ලදි. මෙලෙස එක් රැස් කර ගන්නා ලද තොරතුරු තවදුරටත් තහවුරු කර ගැනීම උදෙසා විෂය ප්‍රාමාණිකයන්ගේ අදහස් විමසීම ද සිදු විය. තහවුරු කර ගන්නා ලද තොරතුරු සාකච්ඡාවට හා විශ්ලේෂණයට බඳුන් කරමින් මෙම පර්යේෂණය සිදු කෙරිණි.

**සාකච්ඡාව**

විවිධ විෂයයන් අතර එනම් විවිධ ශික්ෂණ අතර පවතින්නා වූ අන්තර් ක්‍රියාකාරීත්වය අන්තර්ශික්ෂණය යනුවෙන් හඳුන්වා දිය හැකි ය. එසේ ම එක් එක් විෂයයන්, විවිධ ප්‍රවේශ හා විවිධ පරාමිති එකට සම්බන්ධ කරනු ලබන ක්‍රමයක් ලෙස ද අන්තර්ශික්ෂණය යන්න පෙන්වා දිය හැකි ය. සාහිත්‍ය පයීතවලට අදාළ ව ද අන්තර්ශික්ෂණය සංකල්පයක් ලෙස වැදගත් වේ. සාහිත්‍ය ශානරයක් ලෙස නවකතාවෙහි ද අන්තර්ශික්ෂණමය පෝෂණයක් හඳුනා ගත හැකි ය. සමාරම්භක නවකතාවල සිට වර්තමානය දක්වා ම නවකතාව සාහිත්‍යාංගයක් ලෙස විවිධ විෂයයන් සමග සම්බන්ධ වෙමින් එක් අතකින් ඒවා පෝෂණය කරමින් ද අනෙක් අතින් ඒ මගින් පෝෂණය ලබමින් ද අන්තර්ශික්ෂණීය මාධ්‍යයක් ලෙස වර්ධනය වී තිබේ. එහි දී ඉතිහාසය, මනෝවිද්‍යාව, සමාජ විද්‍යාව, දර්ශනය, දේශපාලනය ආදි පුළුල් විෂය පරාස හා සම්බන්ධ වෙමින් එම විෂයයන්හි අන්තර්ගත කරුණු නවකතාවේ ආකෘතිය, වස්තු විෂය, කථාවින්‍යාසය, චරිත නිරූපණය ආදිය වෙනස් කිරීමට සූක්ෂ්ම ව යොදාගෙන ඇති ආකාරය හඳුනා ගත හැකි ය. එසේ ම ඓතිහාසික නවකතා, සමාජ විද්‍යාත්මක නවකතා, ක්‍රීඩා නවකතා, මනෝවිද්‍යාත්මක නවකතා ආදි වශයෙන් නවකතාව සම්බන්ධ උපශානර ගොඩනැගීම කෙරෙහි නවකතාවේ අන්තර්ශික්ෂණමය ස්වභාවය බලපා ඇති බව තෝරා ගත් නවකතා කිහිපයක් ඇසුරින් විමර්ශනයට භාජනය කළ හැකි ය. එහි දී ඓතිහාසික නවකතාව, නවකතාවේ උපශානරයක් ලෙස හඳුනා ගත හැකි ය. ඒ අනුව කිසියම් ඓතිහාසික පුවතක් නවකතාවේ ආකෘතිය, අන්තර්ගතය ආදිය වෙනස් කිරීමට යොදා ගන්නා ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. එහි දී ඉතිහාසයේ කරුණුවලින් නවකතාව පෝෂණය වන අතර, ඉතිහාස පුවත් ජනතාව අතරට ගෙන යාමේ උපක්‍රමයක් ලෙස ද නවකතාව හඳුනා ගත හැකි ය. ඓතිහාසික නවකතා ගණයෙහි ලා සැලකෙන සුවිශේෂී නවකතාවක් ලෙස ඩබ්ලිව්.ඒ. සිල්වාගේ **විජයබා කොල්ලය** හඳුන්වා දිය හැකි ය. 1505 දී පෘතුගීසීන් ලංකාව ආක්‍රමණය කිරීමත් සමග ලාංකේය දේශපාලන ඉතිහාසයේ බිහිසුණු අද්දැකීමක් ලෙස 1521 දී සිදු වූ විජයබා කොල්ලය හඳුන්වා දිය හැකි ය. එහි දී

කෝට්ටේ රජු හයවන විජයබාහු රජුගේ පුතුන් තිදෙනා වූ බුවනෙකබාහු, රයිගම් බණ්ඩාර හා මායාදුන්නේ යන කුමාරවරුන් විසින් රාජ්‍ය බලය ලබා ගැනීමේ අරමුණින් තම පියා ඝාතනය කර දැමීමේ සිදුවීම විජයබා කොල්ලය නමින් අතීතයට එක් විය. එකී අතීතය සාහිත්‍ය ක්ෂේත්‍රයට එක් වීමක් ලෙස **විජයබා කොල්ලය** නවකතාව හඳුනා ගත හැකි ය. ඒ අනුව විජයබා කොල්ලය නමින් නවකතාවක් සාහිත්‍යයට එකතු වීමට නවකතාව හා ඉතිහාසය අතර සම්බන්ධය හා නවකතාව ඉතිහාසයෙන් පෝෂණය ලැබීමේ අන්තර්ශික්ෂණමය ස්වභාවය හේතු වී ඇති බව හඳුනාගත හැකි ය. එසේ ම පියදාස වැලිකන්නගේ **සුදු සෙවණැලි** නවකතාව ඉතිහාස කතා පුවතක් ආශ්‍රයෙන් ගොඩනැඟුණු ඓතිහාසික නවකතාවකි. 1948 ජාතික විමුක්ති අරගලය පාදක කොට මිනිසුන්ගේ සමාජ, සංස්කෘතික, දේශපාලන, ආර්ථිකමය වශයෙන් වෙනස් වීමේ ඓතිහාසික පසුබිම විවරණය කරමින් නවකතාව රචනා කර ඇති බව හඳුනා ගත හැකි ය. ලාංකේය ගැමි ජීවිතයේ විපරිණාමය විවරණයට බඳුන් කරන කතුවරයා ඉතිහාසය සූක්ෂ්ම ව නිර්මාණය කරයි. ඉතිහාසයේ යථාර්ථය ඉතිහාස සිදුවීමක් ඇසුරෙන් ප්‍රසාරණය කර දැක්වීම ඓතිහාසික නවකතාවේ දී සිදු වන අතර ඓතිහාසික නවකතා නම් ශානරය නිර්මාණයෙහි ලා නවකතාව ඉතිහාසයෙන් ලබා ගත් පෝෂණය හා විෂයයන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධය හේතු සාධක වී ඇති ආකාරය පැහැදිලි වෙයි. නවකතා ක්ෂේත්‍රයෙහි සුවිශේෂී ශානරයක් ලෙස මනෝවිද්‍යාත්මක නවකතා හඳුන්වා දිය හැකි ය. එහි දී පුද්ගල මනස හා සම්බන්ධ ක්‍රියාදාම නිරූපණය කරනු ලබන මනෝවිද්‍යා විෂයයන්ගෙන් නවකතාව ලැබූ පෝෂණය හා නවකතාව හා මනෝවිද්‍යාව අතර පවත්නා සම්බන්ධය මනෝවිද්‍යා නවකතා ශානරය නිර්මාණය වීමට බලපා ඇති බව හඳුනා ගත හැකි ය. සිරි ගුනසිංහගේ **හෙවනැල්ල** නවකතාව, සමන් වික්‍රමාරච්චි විසින් රචිත **අප්පච්චි ඇවිත්** නවකතාව මෙහි දී විමර්ශනය කළ හැකි ය. විඥානධාරා සන්දර්භ ක්‍රමයෙන් ලියැවුණු පළමුවෙනි සිංහල නවකතාව ලෙස **හෙවනැල්ල** නවකතාව හඳුන්වන අතර, යටි සිත විවරණය කිරීමට සුදුසු ක්‍රමයකින් නවකතාව නිර්මාණය කර ඇති ආකාරයක් දැකිය හැකි ය.  කතාවේ ප්‍රධාන චරිතය වන ජිනදාසගේ සිතිවිලි ඔහු ලවා ම සිතීමට ඉඩ සලස්වා ඇති අතර, ජිනදාසගේ සිතෙහි පහළ වන මනෝභාව පාඨකයා හමුවේ ඉදිරිපත් කිරීමට ග්‍රාමීය සමාජය හා විශ්වවිද්‍යාලීය ජීවිතය ද සෙවණැල්ලක් මෙන් ඔහු පසුපස සිටින මවගේ චරිතය ද යොදාගෙන ඇති බව හඳුනා ගත හැකි ය. යටි සිත සහ උඩු සිත තේරුම් ගත නොහැකි ව ජීවන මාවතේ අතරමං වූ තරුණ ශිෂ්‍යයෙකුගේ ජීවිතය විවරණය කරන **හෙවනැල්ල** නවකතාව මනෝවිද්‍යාවෙන් ලද පෝෂණය හේතුවෙන් මනෝවිද්‍යාත්මක නවකතා ශානරයෙහි ලා සැලකෙන බව හඳුනා ගත හැකි ය. සමන් වික්‍රමාරච්චි විසින් රචිත **අප්පච්චි ඇවිත්** නවකතාව නිශ්ශංක නම් ප්‍රධාන චරිතය මඟින් කතාව ඉදිරිපත් කරයි. තම බිරිඳ හා දියණියගේ ඝාතනය සමඟ නිශ්ශංකගේ මනෝභාවයන්හි ස්වභාවය නවකතාව පුරා විග්‍රහ වේ. නිශ්ශංක තම සිතෙහි මවා සිටින පියා ජීවමාන අයකු නො ව මානසික සිතුවිල්ලක් පමණකි. නවකතාවේ ප්‍රධාන චරිතය විසින් සිතෙහි මවා ගත් සිදුවීම් සමූහයක් පාදක වූ මෙම නවකතාව මනෝවිද්‍යාත්මක නවකතා ශානරයෙහි ලා සැලකෙන්නේ නවකතාවේ අන්තර්ශික්ෂණමය පෝෂණය හේතුවෙනි. මේ අනුව මනෝවිද්‍යාත්මක නවකතා ශානරය නිර්මාණය වීම කෙරෙහි ද නවකතාව හා මනෝවිද්‍යාව විෂයයන්හි අන්තර්ශික්ෂණමය පෝෂණය හේතු වී ඇති

9 772950 655005

බව පැහැදිලි ය. මෙලෙස විවිධ විෂයයන් අතර පවත්නා සම්බන්ධය හා විවිධ ශික්ෂණ එකිනෙකින් පෝෂණය වීම අන්තර්ශික්ෂණය ලෙස හඳුන්වා දිය හැකි අතර, නවකතාව සම්බන්ධ ඓතිහාසික නවකතා, මනෝවිද්‍යාත්මක නවකතා ආදි උපශානර නිර්මාණය වීම උදෙසා එකී අන්තර්ශික්ෂණමය පෝෂණය බලපා ඇති බව ප්‍රතීයමානිත ය.

## සමාලෝචනය

විවිධ විෂයයන් හා විවිධ ශික්ෂණයන් අතර පවත්නා අන්තර් සම්බන්ධතාව අන්තර්ශික්ෂණය යනුවෙන් සරල ව හඳුන්වා දිය හැකි ය. එක් එක් ශික්ෂණයක ක්‍රියාකාරීත්වය අනෙක් ශික්ෂණයෙහි ස්වරූපය කෙරෙහි කුමන හෝ ආකාරයක බලපෑමක් සිදු කරන අතර සෑම ක්ෂේත්‍රයක ම කිසියම් ආකාරයක අන්තර් ශික්ෂණමය ස්වභාවයක් හඳුනා ගත හැකි ය. සාහිත්‍යමය ශානරයක් ලෙස නවකතාවෙහි ද අන්තර් ශික්ෂණමය පෝෂණය දැකිය හැකි අතර, නවකතාවෙහි උපශානර බිහි වීම කෙරෙහි නවකතාවෙහි අන්තර් ශික්ෂණමය ස්වභාවය ප්‍රබල ලෙස බලපෑම් කර ඇති ආකාරයක් හඳුනා ගත හැකි ය. නවකතාව මනෝවිද්‍යාව හා අන්තර්ශික්ෂණීය වශයෙන් පවත්නා සම්බන්ධය මනෝවිද්‍යාත්මක නවකතා නම් උපශානරය නිර්මාණයෙහි ලා බලපා ඇති බව **අප්පච්චි ඇවිත්** හා **හෙවනැල්ල** නවකතා ද්විත්වයෙන් පැහැදිලි වන අතර ඓතිහාසික නවකතා ශානරයේ නිර්මාණයෙහි ලා ඉතිහාසය හා නවකතාව අතර සම්බන්ධය හේතු වී ඇති බව **විජයබා කොල්ලය** හා **සුදු සෙවණැලි** නවකතා මගින් මනා ව පැහැදිලි වේ. ඒ අනුව ඓතිහාසික නවකතා, මනෝවිද්‍යාත්මක නවකතා ආදි වශයෙන් නවකතාවෙහි උපශානර බිහි වීම කෙරෙහි නවකතාවෙහි අන්තර්ශික්ෂණමය පෝෂණය බලපා ඇති බව නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත මූලාශ්‍රය නාමාවලිය

ඒකනායක, ධර්මසිරි. (2012). **සාහිත්‍ය හා විචාර කලාව**. බොරලැස්ගමුව: සංස්කෘතික ප්‍රකාශන.

ගුනසිංහ, සිරි. (2015). **හෙවනැල්ල**. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයතිලක, කේ. (1979). **නවකතාව හා සමාජය**. කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ.

තිලකරත්න, මිණිවන් පී. (2018). **සියවසක පෙරළිය හා සිංහල නවකතාවේ පදනම**. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මාගම්මන, ප්‍රේමචන්ද්‍ර. (1988). **සිංහල නවකතාවේ නව නැම්ම**. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මැද්දේගම, උදය ප්‍රශාන්ත. (1999). **සියවසක සිංහල නවකතා**. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වැලිකන්නගේ, පියදාස. (2011). **සුදු සෙවණැලි**. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමාරච්චි, සමන්. (2020). **අප්පච්චි ඇවිත්**. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

විමල්, සාමිනාදන්. (2018). ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ අන්තර්ශික්ෂණ අධ්‍යයනය, සිරිසුමන හිමි, අගලකඩ. සහ ජයසේන, නාලක. (සංස්.). **සිංහල අධ්‍යයන ක්ෂේත්‍රයේ අන්තර්ශික්ෂණීය ස්වභාවය**, නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

9 772950 655005

සිල්වා, ඩබ්. ඒ. (2019). **විජයබා කොල්ලය**. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

සුරවීර, ඒ. වි. (1982). **සමාජීය සාහිත්‍ය අධ්‍යයනය**. කොළඹ: ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස්.

හෆ්, ග්‍රැහැම්. (2009). **සාහිත්‍ය විචාර රචනා**. ඒ.වී. සුරවීර. (අනු). බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

ඩබ්.කේ.ඩී.ඩබ්. මල්ෂානි

සිව්වන වසර

සිංහල අධ්‍යයනාංශය

රුහුණ විශ්වවිද්‍යාලය

dinushawathsala29@gmail.com

9 772950 655005